**ඉන්දියානු සහකාර මහ කොමසාරිස් කාර්යාලය**

**මහනුවර**

***

**මාධ්‍ය නිවේදනය**

**මහනුවර ඉන්දියානු සහකාර මහ කොමසාරිස් වෛද්‍ය ආතිරා එස්. මහත්මිය ගරු මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් යූ ගමගේ මහතා හමුවීම.**

මහනුවර ඉන්දියාවේ සහකාර මහ කොමසාරිස් වෛද්‍ය ආතිරා එස්. මහත්මිය 2021 අගෝස්තු 12 වන දින ගරු මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් යූ ගමගේ මහතා ආණ්ඩුකාර කාර්යාලයේදී හමුවිය.

ගරු. වෛද්‍ය ආතිරා එස්. මහත්මිය මහනුවරට පිළිගත් ආණ්ඩුකාරවරයා මධ්‍යම පළාතේ බල ප්‍රදේශය තුළ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව ඉන්දීය රජය වෙත සිය ප්‍රසංසාව පළ කළේය. ඔහු පල්ලෙකැලේ ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ ඇකඩමියේ (සීබා)උඩරට නැටුම් ඇකඩමියේ සහ ඉන්දියානු නිවාස ව්‍යාපෘතින්වල වැදගත්කම අවධාරණය කළේය.

මෙම කොවිඩ් කාලය තුළ සුවසැරිය හදිසි ගිලන් රථ සේවාව අගය කිරීම. ඉන්දියා ශ්‍රී ලංකා සබඳතා තවදුරටත් ශක්තිමත් කර ගැනීම සඳහා එකට වැඩ කිරීමට ආණ්ඩුකාරවරයා සිය සතුට පළ කළේය.

ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදිගේ උපදෙස් පරිදි 1990 ඇම්බියුලන්ස් සේවාව ඇමරිකානු ඩොලර් මිලියන 22.5 ක අන්තර් රාජ්‍ය ප්‍රදානයක් මඟින් ත්‍යාග කළ අතර දැන් එය සාර්ථකව ශ්‍රී ලාංකික සෞඛ්‍ය අංශයේ ක්‍රියාත්මක වන බව සිහිපත් කළහ.

සහකාර මහකොමසාරිස්තුමිය ආණ්ඩුකාරවරයා වෙත සිය සුබ පැතුම් එක් කළ අතර වර්තමාන වසංගත තත්ත්වය පිළිබඳව සාකච්ඡා කළාය. ඉන්දියානු රජය විසින් ක්‍රියාත්මක සංවර්ධන මුලපිරීම් පිළිබඳව ඇය අවධාරණය කළාය. එමෙන්ම දෙරට අතර සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා ඉන්දියාව කටයුතු කිරීමේ වැදගත්කම අවධාරණය කළාය.

***

මහනුවර

12.08.2021